මගේ අංකය - ඩී14/ හෙද බඳවා ගැනීම -2026
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2026.03. ෆ

මූලස්ථාන අධිකාරි , සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ,
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත

<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරී (III ශ්‍රේණිය) තනතුර සඳහා සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම - 2026</u>

මෙම දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරී (පිරිමි) තනතුරේ පුරප්පාඩු 08 ක් පිරවීම සඳහා පහත දක්වා ඇති කායික හා අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව, මෙයට අමුණා ඇති ආකෘති පත්‍රයට අනුකූලව සකස් කර ගන්නා ලද අයදුම්පත් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව 2026.03.31 දිනට ප්‍රථම බන්ධනාගාර මූලස්ථානයේ ආයතන අංශය වෙත එවිය යුතුය. **අවශ්‍ය සුදුසුකම් නොමැති අයදුම්කරුවන්, නියමිත ලෙස අයදුම්පත සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

03. වැටුප්

3.1 වැටුප් කේත අංකය : MT 7 - 2025

3.2 වැටුප් ක්‍රමය : රු. 54,920 -10 x 800 – 11 x 1,190 – 10 x 1,320– 10 x 1,350 – 102, 710

3.3 පුහුණු කාලය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව පුහුණු කාල සීමාව සඳහා එහි උපලේඛන VI සඳහන් පරිදි ගෙවීම් කටයුතු සිදුකරනු ලැබේ.

04. **තනතුරෙහි ස්වභාවය**
ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

05. **බඳවා ගැනීමේ සුදුසුකම්:**

අ.

i. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
iv. අවම උස අඩි 05 අඟල් 04 – 162.5 cm
v. අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32ක් විය යුතුය.

ආ. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යාව/විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම, පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් තුනකින් එකවර සමත් වීම.

සහ

සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන් හතර (4)කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හය(6) කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

ඇ. **සුදුසුකම් පිළිබඳ සීමාවන්**

i. මෙම තනතුර සඳහා අයදුම්කිරීමට අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. ඉහත 5 (අ) හි සඳහන් සුදුසුකම් තනතුරට බඳවා ගන්නා තෙක් පැවතිය යුතුය.

iii. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය. (අ.පො.ස (සා.පෙළ) හා (උ/පෙළ) විභාග සඳහා විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාගත් විභාග සහතිකවල පිටපත් ඉදිරිපත් කල යුතුය.)

06. **වයස් සීමාව** : අදාළ නොවේ.

07. **බඳවා ගැනීමේ ක්‍රමය** : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ දැනුම්දීම මත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් මගින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කර පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉහළම සුදුසුකම් සපුරාලනු ලබන අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්(වැ.බ.)

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.